


# ජාතික ස්වයං - නිර්ණ අයිතිය සහ පලස්තීන-ඊශ්‍රායෙල් ප්‍රශ්නය

මා මීට ඉහත දී දැක්වූ ආකාරයට ලෝකයේ දිග්ගැස්සෙමින් කෙරී ගෙන යන නොයෙක් ප්‍රචණ්ඩ අරගල වල අත්දැකීම් වලින් පෙනෙන්නේ මකියාවෙලිගේ දර්ශනය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්නට තිබෙන නොහැකියාවයි. ජෝන් ලක් (John Locke) පවසන අන්දමට නම්, යම්කිසි ආණ්ඩුවක් දුෂ්ට පාලනයක් පවත්වා ගෙන යන්නේ නම්, එම ආණ්ඩුව රටේ ජනතාවගේ ආණ්ඩුවක් ලෙස සළකන්නට නොහැකියි. ඔහු පවසන්නේ එවැනි ආණ්ඩුවක් විසින් පීඩාවට පත් කොට ඇති ජන කොටසක් ඇත්නම්, ඒ ජන කොටස කල් ගෙවන්නේ අලුත් ආණ්ඩුවක් සදා ගැනීම සඳහා ඔවුන්ට අයිතියක් තිබේය යන හැඟීමෙන් යුක්තව බවයි.

අද ජාත්‍යන්තර දේශපාලනයේ බරපතලම ගැටළුව වී තිබෙන පලස්තීන සහ ඊශ්‍රායල ජනතාවන්ගේ ප්‍රශ්නය දෙස මඳකට යොමු වෙමු. යහපත් ලෙස ආණ්ඩු කරනු ලැබීමට ජනතාවට තිබෙන අයිතිය සහ ජාතික ස්වයං-නිර්ණ අයිතිය අතර පවතින වෙනස්කම, මෙම පලස්තීන සහ ඊශ්‍රායල ප්‍රශ්නය උදාහරණයක් ලෙස ගැනීම මඟින් පැහැදිලි කර ගත හැකි වේ යැයි කල්පනා කරමි. එහෙත් මෙම ප්‍රශ්නය ලංකාවේ දැනට පවතින ප්‍රශ්නයට වඩා විශාල වශයෙන් වෙනස් ස්වරූපයක් දරයි. ඒ අතරම, ඇතැම් අවස්ථාවන්හිදී පලස්තීන සහ ඊශ්‍රායල ප්‍රශ්නයත්, ලංකාවේ දැනට පවතින ප්‍රශ්නයත් අතර සමාන ස්වරූපයක්ද දක්නට ලැබෙන බව මගේ අදහසයි.

ඇමෙරිකාවේ සහ මහා බ්‍රිතාන්‍යයේ මූලික මැදිහත්වීමත්, බල කර සිටීමත් මත එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඒ කාලයේ පැවතුණු පලස්තීන දේශය 1948 දී යුදෙව් රාජ්‍යය, අරාබි රාජ්‍යය සහ ජෙරුසලම ප්‍රදේශය යනුවෙන් කොටස් තුනකට බෙදා වෙන් කරන්නට නියමිතව තිබුණා. මෙම කාලය වන විට පලස්තීනය තුළ යුදෙව් ජාතිකයන් සියයට 33 කුත්, යුදෙව් නොවන ජාතිකයන් සියයට 67 කුත් සිටියා. එක්සත් ජාතීන්ගේ යෝජනාවට අනුව, පන් ලක්ෂයක් වූ යුදෙව් ජාතිකයන්ගෙන් සහ 325,000ක් වූ අරාබි පලස්තීන ජාතිකයන්ගෙන් සමන්විත යුදෙව් රාජ්‍යය සඳහා මුල් පලස්තීන භූමියෙන් (ජෙරුසලම හැර) සියයට 56.47ක් ද, අට ලක්ෂයක් වූ අරාබි ජාතිකයන්ගෙන් සහ 10,000ක් වූ යුදෙව් ජාතිකයන්ගෙන් සමන්විතව අරාබි පලස්තීන රාජ්‍යය සඳහා සියයට 43.53ක් ද වශයෙන් වෙන් කරන්නට නියමිතව තිබුණා. මෙම යෝජනාවට අනුව, ජාත්‍යන්තර භාරකාර පාලනයක් යටතේ ජෙරුසලම පිහිටි ප්‍රදේශය 105,000 ක් වූ අරාබි ජනයන්ගෙන් ද 10,000ක් වූ යුදෙව් ජනයාගෙන් ද සමන්විත විය යුතුව තිබුණා.

එහෙත් 1947 නොවැම්බරයේ සිට 1948 ජුනි මාසය දක්වා වූ කාලය තුළ දී යුදෙව් ජාතිකයින් විසින් අරාබි ජාතිකයින්ට එල්ල කරන ලද පහරදීම් හේතුවෙන් 300,000 ක් පමණ වූ යුදෙව් නොවන ජන කොටස් ඔවුන්ගේ මුල් භූමි ප්‍රදේශ වලින් පලවා හැර තිබුණා. එක්සත් ජාතීන්ගේ යෝජනාවට අනුව ඊශ්‍රායල් රාජ්‍යය 1948 දී පිහිටු වන විට පවා, යෝජනා කරන ලද ප්‍රදේශයට වඩා වැඩි භූමි ප්‍රදේශයක් ඊශ්‍රායලය විසින් අත්පත් කරගෙන තිබුණා.

**_1921 දී එක්සත් ජනපදයේ සිට පලස්තීනයට පැමිණි ඇය කියා සිටියේ, අනාථයන් බවට පත්ව සිටින පලස්තීනුවන් හැරෙන්නට, පලස්තීනය යනුවෙන් ජනතාවක් හෝ රාජ්‍යයක් ඉතිහාසයේ නොතිබුණු බවයි. ඊශ්‍රායල් රාජ්‍යය විසින් එදා පටන් අද දක්වාම කරනු ලබන්නේ පලස්තීන සහ අරාබි භූමි ප්‍රදේශ අල්වා ගැනීම මඟින් ඊශ්‍රායල් රාජ්‍යය නොකඩවා ප්‍රසාරණය කිරීමයි._**




යුදෙව් රාජ්‍යය බිහි කිරීමට මුල් වූ සියොන් (Zion) වාදය වර්ධනය වුණේ 19 වන සියවසේ සිට වැඩෙමින් තිබුණු සෙමිටිවාද විරෝධී රැල්ලට පිළිතුරු වශයෙනුයි. ඒ කාලයේ යුදෙව් ජන කොටස් ඉතාමත් දරුණු ආකාරයේ විනාශ කර දැමීම් වලටත්, ඉතාමත් නීච ආකාරයේ වද බන්ධන පැමිණවීම් වලටත් ලක් කරමින් තිබුණා. මා අසා ඇති අන්දමට, මෙම තත්ත්වය වඩාත් උග්‍ර බවට පත් වුණේ ආර්යයන් (උතුම්) යැයි කියා ගත් නාට්සි :හ්'ස* වාදීන් විසින් යුදෙව් ජාතිකයින්ව පණ පිටින් හම ගසා, වෙඩි තබා, යුදෙව් ජාතිකයින්ගේ සිරුරු වල කොටස් කපා වෙන් කොට වෙනත් ශරීර වලට සවි කොට, එල්ලා හෝ විෂ වායු යෙදූ කාමර වලට ඇතුළු කොට ඔවුන් මරා දැමීමෙනුයි. මරා නොදැමුණු යුදෙව් ජාතිකයින්ට මැරෙන තෙක් වහල් වැඩ කරන්නට සිදු වුණා. (ලංකාවේ කිහිප දෙනෙකුද ඇතුළුව) නාට්සිවාදීන්ට ආශීර්වාද කළ අය හැරුණු විට, මෙසේ යුදෙව් ජාතිකයන් සමූල ඝාතනය කිරීමට එරෙහිව එක්සත් වුණු සියළු දෙනාගේම අනුකම්පාව සහ සහයෝගය යුදෙව් ජාතිකයන්ට ලැබුණා.

මුලින් පිහිටි පලස්තීන භූමි ප්‍රදේශය වෙන් කොට ගෙන වාර්ගික පදනමක් මත ශුද්ධ වූ යුදෙව් ජාතික රජයක් බිහි කිරීමට යෝජනා කරන ලද්දේ සියොන් වාදීන් විසිනුයි. මුළු මහත් පලස්තීන භූමි භාගය තුළම, යුදෙව් මාතෘ භූමියක් යළි පිහිටුවා ගැනීමයි සියොන් වාදීන්ගේ අරමුණ වුණේ. මෙම අරමුණ ඉදිරියට ගෙන යාම සඳහා ඊශ්‍රායල් රාජ්‍යයට සහයෝගය පළ කරමින්, එම රාජ්‍යය වර්ධනය කර ගැනීමට ආධාර කිරීම දැන් පවතින නව සියොන්වාදයේ ඉලක්කය වී තිබෙනවා. අරාබි ජාතිකයින් සමඟ සමානයින් ලෙස ජීවත් වන්නට සියොන්වාදීන්ට අවශ්‍ය නැහැ. 1948 දී ඊශ්‍රායල් රාජ්‍යයේ පළමු අගමැතිවරයා බවට පත් වුණු ඩේවිඩ් බෙන් ගූරියොන් (David Ben-Gurion) මහතා 1938 දී ප්‍රකාශ කොට තිබුණා, ඊශ්‍රායලය ශක්තිමත් රාජ්‍යයක් බවට පත් වුණු කාලයක මුල් පලස්තීන භූමි ප්‍රදේශය මුළුමනින්මත්, සදහටමත් ඊශ්‍රායල් රාජ්‍යය බවට පත් කර ගන්නා බව.


විනාශ වූ පලස්තීන ගොඩනැගිල්ලක්

1969 දී ඊශ්‍රායල් රාජ්‍යය හතර වැනි අගමැතිවරිය ලෙස තෝරා පත් කරගන්නා ලද ගෝල්ඩා මෙයර් (Golda Meir) මහත්මියගේ ප්‍රකාශයක්ද මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. 1921 දී එක්සත් ජනපදයේ සිට පලස්තීනයට පැමිණි ඇය කියා සිටියේ, අනාථයන් බවට පත්ව සිටින පලස්තීනුවන් හැරෙන්නට, පලස්තීනය යනුවෙන් ජනතාවක් හෝ රාජ්‍යයක් ඉතිහාසයේ නොතිබුණු බවයි. ඊශ්‍රායල් රාජ්‍යය විසින් එදා පටන් අද දක්වාම කරනු ලබන්නේ පලස්තීන සහ අරාබි භූමි ප්‍රදේශ අල්වා ගැනීම මඟින් ඊශ්‍රායල් රාජ්‍යය නොකඩවා ප්‍රසාරණය කිරීමයි. ඇතැම් බටහිර රටවල ආධාරත්, සහයෝගයත් ඇතිව ඊශ්‍රායල් රාජ්‍යය සතුව දැන් න්‍යෂ්ටික අවි ද තිබෙන බව කිසිවෙකුටත් රහසක් නොවේ යයි සිතමි. එහෙත් දිනෙන් දිනම ප්‍රසාරණය කරමින් තිබෙන ඊශ්‍රායල් රාජ්‍යයේ තර්ජනයට ලක් වී තිබෙන මැද පෙරදිග රාජ්‍යයන් සඳහා තම ආරක්ෂාව වෙනුවෙන්වත් වැඩ පිළිවෙළක් සකස් කරගන්නට මඳ ඉඩකඩක් හෝ ලැබෙන්නේ නැත.

පලස්තීන - ඊශ්‍රායල් ගැටළුව සාකච්ඡා කිරීම තුළින් මා මතු කරන්නට අදහස් කරන කාරණය නම්, පලස්තීනය යනුවෙන් ජනතාවක් නොමැති යයි ඊශ්‍රායලය ප්‍රකාශ කරන විට එයින් අදහස් වන්නේ කුමක්දැයි යන්න පැහැදිලි කිරීමටයි. ඊශ්‍රායල් රාජ්‍යය සහ සියොන් වාදය විසින් මෙතෙක් පලස්තීන ජනතාවගේ ජාතික ස්වයං-නිර්ණ අයිතිය ප්‍රතික්ෂේප කොට තිබේය යන චෝදනාව නිෂේධ කර දැමීමට උත්සාහ කිරීම ඊශ්‍රායලයේ අදහසයි. පලස්තීන ජනතාව සහ ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාර විසින් පවසා සිටින්නේ, අඩුම තරමින්, පලස්තීන ජන කොටස් වල අයිතීන් පැහැර ගැනීම් සම්බන්ධයෙන් ඔවුන් සාමූහිකව විඳ දරා ගෙන තිබෙන අත්දැකීම් සම්භාරය මත පමණක් වුවද, පලස්තීන ජාතිකයන් ජනතාවක් වශයෙන් පිළි ගත යුතුව තිබෙන බවයි.

යුදෙව් වාදීන් අනෙක් අතට කියා සිටින්නේ ආබ්‍රහම්ගේ කාලයේ සිටම ඔවුන් ජනතාවක් වූ බවත්, පලස්තීන භූමි ප්‍රදේශය ඔවුන්ගේ මුල් මාතෘ භූමිය වී තිබුණු බවත්ය. අද සිටින යුදෙව් ජාතිකයින් බොහෝ දෙනෙක් උත්පත්තියෙන් යුදෙව් ජාතිකයින් නොවූ බවත්, යුදෙව් ආගම පසු කාලයකදී වැළඳ ගැනීම මඟින් යුදෙව් ජාතිකයින් බවට පත් වූ අය බවත් පවසමින් පලස්තීන ව්‍යාපාර ඉහත පැවසූ යුදෙව් වාදීන්ගේ මතයට විරෝධය පාති. මෙම විරෝධය යටපත් කර දැමීම සඳහා යුදෙව් ජාතිකයෝ තමන්ගේ ජාන පරීක්ෂා කිරීමට පවා පෙළඹී සිටිති.

මෙම වංගගිරියෙන් ඉවත් වී ප්‍රඥා ගෝචර ලෙස කටයුතු කරන්නට මාර්ගයක් තිබෙනවද? පලස්තීන ජන කොටස් සහ යුදෙව් ජන කොටස් ඔවුන්ගේ පරම්පරාව මත හෝ, භාෂාව මත හෝ, සංස්කෘතිය මත හෝ, සාමූහික අත්දැකීම මත හෝ ජනතාවක්ද, ජාතියක්ද යන ප්‍රශ්නය විසඳන්නට උත්සාහ කරනවට වඩා, පලස්තීනයේ වසන ජනයාට ඔවුන්ගේම වූ ආණ්ඩුවක් පිහිටුවා ගැනීමටත්, නීති පද්ධතියක් ඇති කර ගැනීමටත් තිබෙන අයිතිය, එනම් ඔවුන්ගේ පොදු යහපත සඳහා ක්‍රියාත්මක වන ආකාරයේ ආණ්ඩුවක්, ඔවුන්ගේ උවමනා එපාකම් ගැන වගකියන ආකාරයේ ආණ්ඩුවක් ඇති කර ගැනීමට තිබෙන අයිතිය පිළි ගැනීමය යන්න මගේ අදහසයි. ඒ සඳහා පලස්තීනුවන් ජනතාවක් ලෙස සැලකීමේ වරදක් තිබේද?

මී ළඟට බහු ජාතික සමාජයක් තුළ ජාතික ස්වයං-නිර්ණ අයිතිය පිළිබිඹු වන්නේ කෙසේදැයි සාකච්ඡා කරමු.

**ලයනල් බෝපගේ**

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243